# ලොව දිදුලන මැණික්

**අනුර සමරවීර**

> අපේ රටින් බහුලව ලැබෙන අගනා මැණික් වර්ග කිපයක් වන්නේ නිල්, රතු, පසිංගල්, ආර්නුල්, වෛරෝඩි වැනි මැණික් වර්ගද හමුවේ. එසේම රබන, තෝරමල්ලි, පළිගු වැනි අර්ධ මැණික් ද මේ අතරට ගැනේ.

**ශ්‍රී ලංකාව සතු අගනා ස්වභාවික සම්පත් අතුරින් 'ශ්‍රී ලංකා මැණික්' සඳහා හිමිව පවතින්නේ සුවිශේෂී ස්ථානයකි. ඈත අතීතයේදී පවා අපේ මැණික් ලෝකය පුරා ප්‍රචලිතව පැවති බවට ඉතිහාසය සාක්ෂි දරයි. පෙර දවස මෙරට 'රත්නදීප' ලෙස හඳුන්වා ඇත්තේද එබැවිනි.**

ශ්‍රී ලංකාවේ ඉපැරණි කර්මාන්තයක් ලෙස පැවති මැණික් කර්මාන්තය පිළිබඳව විවිධ තොරතුරු පැරණි පොතපතෙහි ග්‍රන්ථාරූඪ වී තිබේ. අතීත තොරතුරුවලට අනුව දේවානම්පියතිස්ස රජතුමා විසින් අශෝක අධිරාජ්‍යයා වෙත යැවූ තුටු පඬුරු අතර මැණික්ද වූ බව මහා වංශයේ සඳහන් වෙයි. රුවන්වැලි මහ සෑයේ නිදන් තැන්පත් කිරීම සඳහා මැණික් පූජා කිරීම සිදුවී තිබේ. එසේම පාහියන් භික්ෂුව, මාර්කෝපෝලෝ, ඉබන් බතූතා, රොබට් නොක්ස් ආදී ගවේෂකයන්ද ශ්‍රී ලංකා මැණික් පිළිබඳව විවිධ තොරතුරු තම ලේඛනවල සඳහන් කර තිබේ.

කෙසේ වෙතත් රාජ වංශික යුගයන්හිදී සියළු මැණික් ඉඩම් රජුට අයත් ඉඩම් ලෙස සලකා ඇති අතර රජවරු තම භාණ්ඩාගාරය මැණික් වලින් පුරවා ගැනීමට උනන්දුවක් දක්වා තිබේ. එසේම ක්‍රි. ව. 1 වන විටද මෙරට මැණික් ජාත්‍යන්තරව අලෙවි වී ඇති අතර මහා වංශයට අනුව මහා පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේදී මැණික් කර්මාන්තය සඳහා පත්කළ 'අත්තරංග' නම් අමාත්‍යවරයකුද රාජකාරී ඉටුකර ඇති බව පෙනීයයි. පසු කලක පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි යටත් විජිත සමයන්හිදී ඔවුන් ධනය රැස්කිරීම මූලික කරගනිමින් කටයුතු කළ නිසා එම සමයේදී කර්මාන්තයේ වැඩි දියුණුවට යම් සේවයක් සිදුවී ඇති බවක් නොපෙනෙයි. එනමුදු 1890 වර්ෂයේදී ඉංග්‍රීසි ජාතිකයන් විසින් මැණික් ගැරීමේ කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යෑමේ අටියෙන් එම කටයුත්ත නීත්‍යානුකූලව ඉටුකිරීම සඳහා 'මැණික් ආඥාපනත' ක්‍රියාවට නංවනු ලැබිණ.

ශ්‍රී ලංකා මැණික් පිළිබඳ තොරතුරු සොයා බැලීමේදී මෙරටින් විවිධ මැණික් වර්ග 80 ක් පමණ හමුවන බව පෙනීයයි. එය දෙවැනි වන්නේ බ්‍රසීලයට පමණකි. මෙරට මැණික් අතුරින් අගනාම මැණික් හමුවන නිධිය අවිස්සාවේල්ල බලංගොඩ හා අකුරැස්ස යන නගර සම්බන්ධ වන ලෙස සැකසුණු ත්‍රිකෝණාකාර බිම් කඩක පිහිටා තිබේ. ඊට අමතරව ඇලහැර ඔක්කම්පිටිය ආශ්‍රිත ප්‍රදේශද මැණික් ලබන ප්‍රදේශ අතරට ගැනෙයි.

අපේ රටින් බහුලව ලැබෙන අගනා මැණික් වර්ග කිපයක් වන්නේ නිල්, රතු, පසිංගල්, ආර්නුල්, වෛරෝඩි වැනි මැණික් වර්ගද හමුවේ. එසේම රබන, තෝරමල්ලි, පළිගු වැනි අර්ධ මැණික් ද මේ අතරට ගැනේ. මේ ලෙස අප රටින් බහුලව හමුවන මැණික් 'කොරන්ඩම් මැණික්' ලෙස හඳුන්වයි.

අපේ රටෙන් හමුවන මේ මැණික් වර්ග මහපොළොවේ ගොඩනැගී ඇත්තේ මීට වසර හැට කෝටියකට පමණ ඉහතදී බව විද්‍යාඥයන්ගේ මතයයි. ලංකාවෙන් මැණික් ලැබෙන ප්‍රදේශ 'ඛොන්ඩලයිට්' නම් පාෂාණ පද්ධතියට අයත්වන අතර ඒවා පිහිටා ඇති භූමි ප්‍රමාණය වර්ග සැතපුම් පන්සියයකට ආසන්න වේ. මෙම කඳු පෙදෙස, හිමාලය කඳු වලටත් වඩා පැරණි ලෝකයේ ඇති ඉපැරණිම ගොඩබිමක් ලෙස සැලකෙයි. මෙය සනාථ වන්නේ 'ඛොන්ඩලයිට් පාෂාණ' පද්ධතිය හිමාලය මෙන් විසිගුණයක කාලයක් පැරණි බව තක්සේරුකර තිබීමෙනි. එමගින් මෙම කලාපයෙන් ලැබෙන මැණික්වල වයස් ප්‍රමාණය වසර කෝටි 60 ක් පමණ වන බව පෙනීයයි.

වාර්තා තැබූ ලොව විශාලම මැණික් ගල් කිපයක් මෙරටින් හමුවීම තුළින්ද අපේ මැණික් පිළිබඳව තක්සේරු කරගත හැකිවේ. ලොව විශාලම මැණික ලෙස සැලකෙන මැණික 1907 වර්ෂයේදී කුරුවිටින් හමුවී තිබේ. කැරට් 600 ප්‍රමාණය ඉක්මවූ එම 'බ්ලූ සැපයර්' මැණික කපා ඔපමට්ටම් කළ පසු කැරට් 400 ක පමණ අගනා මැණිකක් බවට පත්වී තිබේ.

ලොව දෙවන විශාලම කැරට් 423 ක නිල් මැණිකද මෙරටින් හමුවූවක් වන අතර මේවා දැනට ඇමරිකා එක්සත් ජනපදයේ ගැනුම්කරුවන් අතට පත්වී පවතී.

පැල්මඩුල්ලෙන් 1926 වසරේදී හමුවූ නිල් මැණික විශාලත්වයෙන් තෙවැනි තැනලබා ඇති අතර එය දැනට බ්‍රිතාන්‍ය ජාතිකයකු සතුව පවතී. මීට අමතරව කැරට් 138 ක් බරැති ලොව විශාලම 'ආර්නුල' ඇමරිකා එක්සත් ජනපදයේද කැරට් 500 ක් බර වෛරෝඩිය කැරට් 47 ක් බර විශාලම පසිංගලය බ්‍රිතාන්‍යයේ හා කැරට් 100 කත් බර පද්මරාගය ඇමරිකානු කෞතුකාගාරයෙහිද පවතී.

ලංකාවෙන් හමුවී ඇති ලොව විරල මැණික් වර්ග අතර ඊකනයිට් ෆයිබ්‍රොලයිට්, ටාෆයිට්, ඇපටයිට්, ඇක්සනයිට්, අයොලයිට් ආදිය ද වේ. 1945 දී ටාෆයිට් වර්ගයද 1953 දී ඊකනයිට් ද මෙරටින් ප්‍රථම වරට හඳුනා ගැනිණි.

ශ්‍රී ලංකාව මෙන්ම තම පොළොවෙන් මැණික් හමුවන ලොව සෑම රටක්ම මෙම වටිනා උරුමයෙන් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට කටයුතු කරයි. මෑත කාලයේදී මේ පිළිබඳව මැඩගස්කරය විශේෂ අවධානයක් යොමුකරමින් ලෝක වෙළඳපලට ඇතුළුවීමට සමත් විය.

මැණික් පිළිබඳ වන මුද්දර මගින් මුද්දර ලෝකයද වර්ණවත් වී තිබේ. ශ්‍රී ලංකාවේ මැණික් මෙන් අගනා මැණික් මුද්දර හතරක් 1976 දී නිකුත් විය. මේ අයුරින් ලොවේ රටවල් රැසකින් මැණික් මුද්දර නිකුත් කර ඇත.

එවන් මුද්දර අතුරින් 1995 වර්ෂයේදී ඔස්ට්‍රේලියාව නිකුත් කළ උපල මැණික් [opel] යුගලක් සහිත මුද්දර යුගල යම් විශේෂත්වයක් සහිත මුද්දර යුගලයකි. එය නිකුත් කරනු ලැබුවේ 1993 වර්ෂයේදී එම මැණික් වර්ගය 'ඔස්ට්‍රේලියාවේ ජාතික මැණික' ලෙස ප්‍රකාශයට පත් කිරීම හේතුවෙනි.

දැන් අප රටද 'නිල් මාණික්‍යය' අපේ ජාතික මැණික ලෙස ප්‍රකාශයට පත්කර ඇත. එබැවින් 'නිල මාණික්‍යය' මුද්දරයෙන් පිදුම් ලැබීමට නැවත වරක් සුදුසුකම් ලබා තිබීම සතුටට කරුණකි. ☐